# දේව ප්‍රකාශන



## පළමුවන කියැවීම

ඉසයියස් 43:16-21

ඉසයියස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි.

**"නැවත දස්කම් පා මාගේ සෙනඟට ජලය ලබා දෙන්නෙමි."**

බොහෝ ඉහත දී සමිඳුණෝ මුහුද මැදින්, මහා ජලය මැදින් පාරක් සෑදූ සේක. එහි බලවත් හමුදුවක් ද රථවාහන හා අශ්වයන් ද එතුමාණෝ විනාශකළ සේක. ඔව්හු නැගිටිය නොහැකි සේ එහි වැටුණෝ ය. පහන් තිරයක දැල්ල නිවී යන්නාක් මෙන් ඔව්හු නැතිවී ගියෝ ය. එහෙත්, සමිඳුණෝ මෙසේ වදාරන සේක: "පසුගිය දේ සිහි නොකරන්න. පෙර වූ දේ ගැන කල්පනා නොකරන්න. බලන්න, මම අලුත් දෙයක් කරන්නෙමි. එය දැනුදු ඉටු වේ. නුඹලාට එය නොපෙනේ ද? මම කාන්තාරයෙහි පවා මාර්ගයක් සාදා, එහි ජලධාරා ඇති වන්න සලස්වන්නෙමි. මා විසින් තෝරාගනු ලැබූ මාගේ සෙනඟට වතුර දෙන පිණිස මා කාන්තාරයෙහි ගංගා ගලා යන්න සැලැසූ නිසා හිවලුන් ද පැස්බරුන් ද ඇතුළු වන සත්ත්වයෝ මට ගෞරව කරන්නෝ ය. ඔව්හු, මා උදෙසා ම, මා විසින් මවන ලද සෙනඟ ය. ඔවුන් මට ප්‍රශංසා කරනු ඇත."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 126:1-6

පිළිතුර: සමිඳුණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක.

ගීය: සමිඳුන් අප මුදා සියොනට ගෙනා කල, අපට එය සිහිනයක් මෙන් විය. එවිට අපි සිනාවෙන් ඉපිලී ගියෙමු. ප්‍රීතියෙන් ගී ගායනා කෙළෙමු. එවිට, "සමිඳුණෝ මොවුන් උදෙසා ඉමහත් දේ කළ සේකැ"යි විජාතීහු කියන්නට ගත්හ.

සමිඳුණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක. එබැවින් අපි සන්තෝෂ වමු. සමිඳුනි, අපේ සිරකරුවන් දකුණු දිශාවේ ගලා යන ඇල දෙළ මෙන් අපට යළි ගෙන දුන මැනව.

දුකින් කෙත වපුරන්නෝ තුටින් අස්වැන්න නෙළාගන්නෝ ය. ඔව්හු වී මලු රැගෙන කඳුළු සල සලා පිටත් ව ගිය නමුත්, තම ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් පින පිනා ආපසු ආහ.

## දෙවන කියැවීම

පිලිප්පි 3:8-14

ශුද්ධ වූ පාවලු තුමන් විසින් පිලිප්පිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටාගත් කොටසකි.

**ක්‍රිස්තුන් වහන්සේගේ මරණයට සහභාගිවීම සඳහා සියලු දේ මට නැති වී ගියත් කම් නැත.**

එපමණකුත් නොවේ, මාගේ ස්වාමීන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ දැනගැන්මේ විශිෂ්ටතාව නිසා ඒ සියල්ල අවාසියකැ යි ගණන්ගනිමි. උන් වහන්සේ නිසා සියලු දේ මට නැති වී ගියා පමණක් නොව, ඒ සියල්ල කුණු කසළ යයි සලකමි. මාගේ කැමැත්ත නම් ක්‍රිස්තුන් වහන්සේ අත්කරගැනීමත්, උන් වහන්සේ හා ඒකාබද්ධ වීමත් ය. ව්‍යවස්ථාවෙන් වන මාගේ ම ධර්මිෂ්ඨකම නොව, ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇදහීම කරණකොටගෙන ඇදහිල්ල නිසා, දෙවියන් වහන්සේගෙන්

වන ධර්මිෂ්ඨකම ලබාගැනීම ය. මට ඕනෑ එක ම දේ නම් ක්‍රිස්තුන් වහන්සේ හා උන් වහන්සේගේ පුනරුජ්ජීවනයේ බලය දැනගැනීම හා ක්‍රිස්තුන් වහන්සේගේ මරණයට සමාන වීමෙන් උන් වහන්සේගේ දුක්වේදනාවලට පංගුකාර වීමත්, යම් අන්දමකින් මළවුන්ගෙන් උත්ථාන වීමට පැමිණීමත් ය. මේ සියල්ල දැනට ම මට ලැබී තිබෙන බවක් වත්, දැනට ම මා සම්පූර්ණ වී සිටින බවක් වත් මම නොකියමි. යමක් පිණිස ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ මා අත්කරගත් සේක් ද, ඒ දේ අත්කර ගැනීම පිණිස මමත් වීර්යයෙන් දුවමි. සහෝදරයෙනි, මම තවමත් ඒ දේ අත්කරගෙන ඇතැ යි නොසිතමි. එක දෙයක් මට වැදගත් ය: පසුගිය දේ අමතක කරදමා, ඉදිරියෙහි තිබෙන දේ දෙස ම නෙත් යොමා, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ මඟින් දෙවියන් වහන්සේ දෙන්නට අදහස් කරන ස්වර්ගීය ත්‍යාගය ලබන පිණිස දිනුම් කණුව කරා මම දුව යමි.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## <u>සාධුකාරය</u>

එසකියෙල් 18:31

"නුඹලා කළ නුඹලාගේ සියලු වරද නුඹලා වෙතින් අහක දමා
අලුත් සිතක් ද අලුත් මනසක් ද නුඹලාට ම සලසා ගන්න."

## <u>ශුද්ධවූ සුවිශේෂය</u>

ජුවාම් 8:1-11

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"පවක් නැති තැනැත්තා පළමුකොට ඇට ගලක් ගසත්වා!"**

ජේසුස් වහන්සේ ඔලීව කන්දට වැඩම කළ සේක. අලුයම උන්වහන්සේ දේව මාලිගාවට වැඩිය සේක. මුළු සෙනඟ උන්වහන්සේ වෙත පැමිණියහ. උන්වහන්සේ වැඩ හිඳ ඔවුන්ට උගන්වා වදාළ සේක. එවිට විනයධරයෝ හා පරිසිවරු කාමමිථ්‍යාචාරයේ හැසිරෙද්දීම අසු වූ ස්ත්‍රියක ගෙනැවිත් ඔවුන් මැද සිටුවා, "ගුරුදේවයෙනි, මේ ස්ත්‍රිය කාමමිථ්‍යාචාරයෙහි යෙදී සිටිය දීම අල්ලා ගන්නා ලද්දීය. මෙබඳු අය ගල් ගසා මරන්නට මෝසෙස් විසින් ව්‍යවස්ථාවෙහි අපට අණ කර ඇත. එහෙත් මැය ගැන ඔබ කියන්නේ කිමෙක්ද" යි උන්වහන්සේගෙන් ඇසූහ. ඔවුන් මෙසේ ඇසුවේ, උන් වහන්සේ පරීක්ෂා කර උන්වහන්සේට වරද තබන්නට කරුණක් සොයාගන්නා අටියෙනි. එහෙත්, උන්වහන්සේ නැමී සිය ඇඟිල්ලෙන් බිම ලියූ සේක. ඔවුන් උන් වහන්සේගෙන් දිගින් දිගට ප්‍රශ්න කරද්දී, උන්වහන්සේ කෙළින් සිට, ඔවුන් අමතා, "ඔබ අතරෙන් පවක් නැති තැනැත්තා පළමුකොට ඇට ගලක් ගසන්නැ" යි වදාරා නැවතත් නැමී සිය ඇඟිල්ලෙන් බිම ලියූ සේක. ඔවුන් ඒ වචන ඇසූ විට, වැඩිහිටියන්ගෙන් පටන්ගෙන එකෙකා බැගින් යන්නට ගියේය. ඉතිරි වූයේ ජේසුස් වහන්සේ ද, ඒ ස්ත්‍රිය ද පමණකි. ජේසුස් වහන්සේ කෙළින් සිට, ඈට කතා කොට, "ස්ත්‍රිය, ඔව්හු කොහේද? කිසිවකු ඔබට වරද තැබුවේ නැද්ද" යි ඇසූ සේක. "ස්වාමීනි නැතැ" යි ඈ කීවාය. "මමත් ඔබට වරද නොතබමි. යන්න, මින්පසු තවත් පව් නොකරන්නැ" යි උන්වහන්සේ ඈයට වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.